


# "මෙලඩිය"

## කපුගේ අභිමුව රන්බණ්ඩා කඳුලු පුරවාගෙන දණගසා ගත්හැටි

සටහන
නීතිඥ උපුල් කුමරප්පෙරුම



"මචං රෑ නවතින්න බලාගෙන රන්බණ්ඩගෙ කාමරයට වරෙං. සින්දුවකට මෙලඩියක් දාන්න තියෙනව"

. ඇමතුම ආවේ කපුගේගෙනි. ගීතයකට තනුවක් යෙදීම සුන්දර වැඩකි. මිත්‍රයා තමාගේ මිත්‍ර සමාගමෙහි තරම දන්නා නිසා අවශ්‍ය අඩුම කුඩුම හැකි පමනින් රැගෙන කොටුව තරුණ බෞද්ධ සංගම් ශාලාවෙහි රන්බණ්ඩාගේ කාමරයට කලුවර සමගම ගොඩ වැදුනේය.

ඒවන විටත් ආනන්ද සහ සිල්වෙස්ටර් රන්බණ්ඩා සහ කපුගේ සමග එක්වී සිටියහ. සෑම කෙනෙකුම පාහේ තමන්ට හැකි අයුරින් විවිධ දෑ ගෙනැවිත් තිබුනේ කාගෙ කාගේත් උවමනාවන් දන්නා නිසාය.

ආනන්ද, කපුගේ සහ රන්බණ්ඩා සර්පිනාවක්ද සමග සුබ කටයුත්ත සඳහා ලක ලෑස්ති වෙති. මිත්‍රයා සහ සිල්වෙස්ටර් ගෙනා කෑම බීම සූදානම් කරති. තනුව යොදන පදවැල ගැන දන්නේ රන්බණ්ඩාත් කපුගේත් පමනි.

සියල්ලෝ රන්බණ්ඩා පදවැල ගැන කෙරුනු හැඳින්වීමට සාවධානව කන්දුන්හ. එය තරමක් දිග ගී පදවැලකි. ගීතයක සීමාවෙන් ඈතට යන වේලාවක් ගතවිය හැකි තරම්ය. මධුවිතෙන් උණුසුම් වෙමින් ඔවුන් ගීතයට අවැසි ලෙස පදවැල කෙටි කර ගත්තේ සැහෙන වෙහෙසක් දරාය. ඒ මධ්‍යම රාත්‍රියත් ගෙවුනු පසුවය. කපුගේත් ආනන්දත් පදවැල දෙස බලමින් සර්පිනවෙන් නික්මෙන ස්වරයනට අනුරූපවන සේ කඩදාසියක ලියැවී ඇති වචන පෙල

**එහෙත් එක නිමේශයක ආනන්ද ඔහුගේ නින්ද බිඳ දමන්නේ ආවේශයකිනි මෙනි. ආනන්දගේ කලබගෑනියෙන් අවදිවන ඔහු දකි න්නේ කපුගේ අභිමුව දණගසාගෙන දෑසෙහි කඳුලු පුරවාගෙන සිටින රන්බණ්ඩාය.**

ගීතයකට පෙරැලීමේ මහා කර්තව්‍යය නියැලී සිටිති. විවිධ ස්වරයන් විවිධ රාගයන් ඔවුන්ගේ දෙතොල් අතෙරින් ගිලිහෙන්නේ ඉමහත්වූ මිහිරි හඬෙකිනි.

වෙහෙසත් මධුවිතත් නැගෙන්නාවූ සංගීතයෙහි ලයාන්විත භාවයත් යන සියල්ල එකතුව අපගේ මිත්‍රයා නින්දට ගෙන ගියේය. නින්දේදී පවා සර්පිනාවෙන් ගිලිහෙන්නාවූ ස්වර රටාවන් සමග මුසුවුනු කපුගේ ගේ හඩ මිත්‍රයාට යාන්තමට ඇසුනේ ද ඔහුට කිසිවක් වැටහුනේ නැත. නින්ද විසින් ඔහුව අකර්මන්‍ය කොට තිබුනේය.

එහෙත් එක නිමේශයක ආනන්ද ඔහුගේ නින්ද බිඳ දමන්නේ ආවේශයකිනි මෙනි. ආනන්දගේ කලබගෑනියෙන් අවදිවන ඔහු දකින්නේ කපුගේ අභිමුව දණගසාගෙන දෑසෙහි කඳුලු පුරවාගෙන සිටින රන්බණ්ඩාය. කපුගේ විලාපයක් සේ "මං එනතුරු ඉදිකඩ ළඟ ඉන්නවාද අම්මේ" ගායනා කරමින් ගීතය අවසන් කරද්දී රන්බණ්ඩා කපුගේට වැඳ නමස්කාර කරන්නේ ඔහු බුදුවන බව පවසමිනි.

සියල්ල සිදුවන්නේ උදෑසන හතරට පහට පමනය. කපුගේ සියලු දෙනා වෙනුවෙන් නැවතත් ගීතය ගායනා කලේය. එය අවසන්වත්ම රන්බණ්ඩා සමග අනෙක් සියල්ලොම ද ඇස්වල කඳුලු පුරවා ගත්හ. කපුගේත් ඇස් කඳුලින් පුරවා ගෙනය. දවසක් පැල නැති හේනේ ගීතය තරුණ බෞද්ධ සංගම් ශාලාවෙහි කාමරය තුලදී ඇසු පලමු රසිකයන් එදා හෙලුවේ සතුටු කඳුලුද නොඑසේනම් කපුගේ ගේ ගායනයෙහි වූ අති සංවේදී භාවය නිසා නැගුනු කඳුලුද එසේ නැතිනම් රන්බණ්ඩා සෙනවිරත්නයන්ගේ පදවැලෙහි වූ සංවේදීභාවය නිසා නැගුනු කඳුලුද එසේත් නැත්නම් මේ සියල්ලගේ එකතුවක්ද යන්න කවුරුන් හෝ දන්නේ නැත.

"දවසක් පැල නැති හේනේල"එසේය. ඒ පිටකොටුවේ තරුණ බෞද්ධ සංගම් ශාලාවෙහි කාමරයෙකය. එදා රන්බණ්ඩා සෙනවිරත්නයන් සහ ගුණදාස කපුගේ මානවවාදියා සමග ඊසතුට බෙදා ගත්තේ ආනන්ද පෙරේරා සංගීතවේදියා සහ සිල්වෙස්ටර් නම් මිතුරෙකු සමග මේ කතාව කියු මිත්‍රයා වන අද සිවිල් සේවයෙන් විශ්‍රාම ගෙන සිටින අසෝක පීරිස් මහතාය.

